# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1986 අංක 1 දරන මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 ජනවාරි මස 17 දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 ජනවාරි මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1986 අංක 1 දරන මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 1986 ජනවාරි මස 17 වන දින]**

එල්. ඩී.—ඕ. 33/85

### මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී විද්‍යාලයේ පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ එකී විද්‍යාල යට සම්බන්ධ සියලු කරුණු ඉටු කිරීමේ කාර්ය සඳහා "සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය" යනුවෙන් හැඳින්වෙන විද්‍යාලයක් මෙතෙක් කල් මාවනැල්ල කෙරමිණියේ පිහිටුවනු ලැබ ඇති හෙයින් ද :

එකී විද්‍යාලයේ කටයුතු සහ පරමාර්ථ මෙතෙක් කල් පාලක සභාවක් විසින් ඉටු කරනු ලැබ ඇති හෙයින් ද :

එකී පාලක සභාව සංස්ථාගත කිරීම සඳහා ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

**1.** මේ පනත 1986 අංක 1 දරන මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ආරම්භ වන දින සිට හා ඉන්පසු (මෙහි මින් මතු "විද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාවේ තත්කාලීන සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මාවනැල්ල කෙරමිණියේ සමස්ත ලංකා පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාලයේ පාලක සභාව" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහිත සංස්ථාවක් විය යුතු අතර සංස්ථාවට පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය තිබිය යුතු ය. තව ද, එම නාමයෙන් සංස්ථාව විසින් සියලු අධිකරණයන්හි නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව, සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) පාරම්පරික ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ඉගැන්වීම සඳහා වූ ජාතික ආයතනයක් වශයෙන් විද්‍යාලය මෙහෙයවීම, පවත්වාගෙන යෑම සහ පරිපාලනය කිරීම ;

(ආ) වෛද්‍ය ශිෂ්‍යයන් පුහුණු කිරීම සඳහා සහ රෝගීන්ට නොමිලේ වෛද්‍ය ආධාර සැපයීම සඳහා ආයුර්වේද රෝහලක් පිහිටුවීම ;

ජ 079377—6,700 (84/09)

(ඇ) පාරම්පරික ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙහි ප්‍රවීණත්වය ලබා ඇති තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්ය සඳහා ආයුර්වේද කොමසාරිස් වරයාගේ අනුමතිය ඇතිව විභාග පැවැත්වීම ; සහ

(ඈ) විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම, ඒවාට අවශ්‍ය උපකරණ සැපයීම සහ එම ගොඩනැගිලි පවත්වාගෙන යෑම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් ආරම්භ කිරීමේ, පවත්වාගෙන යෑමේ සහ වසා දැමීමේ ද, ඇප ඇතිව හෝ නැතිව, මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද, ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවකයන් සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කරවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒවායින් යම් කිසිවක් උන්නතියට පත් කර ගැනීම හෝ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය වන කවර වූ හෝ ක්‍රියා කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

පාලක සභාව.

5. මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී විද්‍යාලයේ පාලක සභාවේ ධුර දරන සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමු වන පාලක සභාව සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී එම රැස්වීමට පැමිණ සිටින සහ ඡන්දය දීමට හිමිකම ඇති සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයට නොඅඩු ඡන්දයකින්, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, යාවජීව සාමාජිකයන් ඇත්නම් ඔවුන් සහ අනෙකුත් සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ ඔවුන්ගේ ධුර කාලය සඳහා ද සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ද මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට පටහැනි නොවන්නා වූ රීති, කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. එසේ සාදනු ලැබූ රීති, එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයට ම වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළ හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

විද්‍යාලය විසින් ගෙවිය යුතු ණය හා එයට ගෙවනු ලැබිය යුතු ණය.

7. මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේදී පැවති විද්‍යාලයේ සියලු ණය සහ වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු අතර විද්‍යාලයට අයවිය යුතු සියලු ණය සහ ගෙවනු ලැබිය යුතු දායක මුදල් සහ ආධාර මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ අන් කිසිවක් හේතු කොට ගෙන සංස්ථාව සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් ලබා ගැනීමට හා දැරීමට නීත්‍යනුකූල ශක්‍යතාව සංස්ථාවට තිබිය යුතු ය. ඒ සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්යයන් සඳහා සහ සංස්ථාවේ රීතිවලට යටත්ව දරනු ලැබිය යුතු ය. තවද, ඒවා විකිණීම, උකස් කිරීම, බදු දීම, හුවමාරු කිරීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම සඳහා පූර්ණ බලය සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. සංස්ථාවේ රීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි මූ සාමාජික යන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී හැර කවර වූ හෝ සාධන පත්‍රයකට සංස්ථාවේ මුද්‍රාව නොතැබිය යුතු අතර එම තැනැත්තන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් ඒ සාධන පත්‍රයෙහි අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම යම් තැනැත්තකු සාක්ෂිකරුවකු ලෙස අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන් කෙරෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිති වාසිකම් හැර, ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාගත මණ්ඩලයක හෝ වෙනත් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.